(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

**අංක 94.]**

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2016 අගෝස්තු මස 25 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 10.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

142/’15

1\.

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2014 මුදල් වර්ෂය තුළ අලාභ ලැබූ රාජ්‍ය ආයතන කවරේද;

(ii) එම ආයතනයන්හි අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත (i) හි සඳහන් ආයතනයන්ගෙන් වෙනත් රාජ්‍ය ආයතනයන්ට ගෙවීමට ඇති මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අලාභ පියවීම සඳහා උක්ත ආයතනයන්ට මහා භාණ්ඩාගාරය මඟින් නිකුත් කළ මුදල් ප්‍රමාණය, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) උක්ත අලාභයන්ට හේතු පිළිබඳ සොයා බැලීමක් කර තිබේද;

(iii) එසේ නම්, එම හේතු එක් එක් ආයතනයට, වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) උක්ත ආයතන ලාභදායී ආයතන බවට පත්කිරීමට පියවර ගන්නේද;

(v) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

558/’16

2\.

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කොළඹ මහ නගර සභාව මඟින් වසර ගණනාවක් මුළුල්ලේ කොළඹ නගරයේ කැළි කසළ මීතොටමුල්ල ප්‍රදේශයට බැහැර කරන බවත්;

(ii) අක්කර 02ක ප්‍රදේශයකට පමණක් කැළි කසළ බැහැර කිරීම සඳහා අවසර දී ඇතත්, අක්කර 12 ක පමණ ප්‍රදේශයකට කැළි කසළ බැහැර කර ඇති බවත්;

(iii) මෙම ගැටලුව හේතුවෙන් කොලොන්නාව ප්‍රදේශයේ ජනතාව අධ්‍යාපනික, සෞඛ්‍ය හා පාරිසරික වශයෙන් දැඩි ලෙස පීඩාවට පත් වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දිනකට කොළඹ නගරයෙන් මීතොටමුල්ලට ගෙන එන කැළි කසළ ප්‍රමාණය කොපමණද;

(ii) කැළි කසළ බැහැර කිරීම සඳහා කොළඹ නගර සභාව, මීතොටමුල්ල වෙනුවට වෙනත් විකල්ප ස්ථානයක් තෝරා ගන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

(iv) කැළි කසළ වෙනත් ස්ථානයකට යොමු කිරීමට පියවර ගන්නේ නම්, ඉන් පසුව දැනට තිබෙන කැළි කසළ ඉවත් කිරීම සඳහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

594/'16

3.

ගරු ලකී ජයවර්ධන මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2014 වර්ෂයේදී සතොස මඟින් ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද සහල් ප්‍රමාණය කොපමණද; ඒ සඳහා වැය වූ මුළු මුදල කොපමණද;

(ii) එම සහල් ප්‍රමාණයෙන් මේ වනවිට අළෙවි කර ඇති ප්‍රමාණය කොපමණද; එමඟින් සතොස ලබා ඇති ලාභය කොපමණද;

(iii) අළෙවි කිරීමට නොහැකි වූ සහල් ප්‍රමාණය කොපමණද; එමඟින් සතොසට සිදු වූ අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙවැනි අලාභයන් සිදුවන්නේ සහල් ආනයනයට පෙර දේශීය වෙළඳපොළ තත්ත්වය සැලකිල්ලට ගෙන කටයුතු නොකිරීම නිසා බව පිළිගන්නේද;

(ii) එසේ නම්, පාඩු ලබන ක්‍රියාවන් එලදායී අන්දමින් සිදු කිරීමට නිසි ක්‍රමවේදයක් සකස් කරන්නේද;

(iii) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද; එය ක්‍රියාවට නංවන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

608/'16

4.

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) හමුදා සාමාජිකයින්ගේ දරුවන් සඳහා වූ පාසල්වලට, නිලධාරින් නොවන යුද හමුදා සාමාජිකයින්ගේ දරුවන් ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් පසුගිය රජය විසින් සකස් කරන ලද ප්‍රතිපත්ති කවරේදැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

618/'16

5.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා,— බුද්ධශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ පිහිටි කෝකිලායි ප්‍රදේශයේ, තිරුඥානසම්බන්ධර් මනිවන්නදාසර් මහතාට අයත් ඉඩමක නීතිවිරෝධී ලෙස බෞද්ධ විහාරයක් ඉදිකරමින් පවතින බව දන්නේද;

(ii) ජනතා විරෝධය විශාල වශයෙන් පැන නැඟී ඇති අවස්ථාවක නීතිවිරෝධීව ඉදිවෙන මෙම විහාරයේ ඉදිකිරීම් කටයුතු වහාම නවතා දැමීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

639/'16

6\.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) නීතිවිරෝධීව ලබාගත් රාජ්‍ය වත්කම් අත්පත් කර ගැනීම පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායේ සාමාජිකයින් කවුරුන්ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම බලකායේ ප්‍රධානියා කවුරුන්ද;

(ii) එය පිහිටුවීමේ අරමුණ කවරේද;

(iii) එහි සාමාජිකයන් හෝ සහායක නිලධාරීන් සංචාරය කර ඇති විදේශීය රටවල් කවරේද;

(iv) සාමාජිකයන් හෝ සහායක නිලධාරීන්ගේ විදේශ සංචාර සඳහා 2016 මාර්තු 31 වැනි දිනට වැය වූ මුළු මුදල කොපමණද;

(v) බලකායේ තීරණ මත 2016 මාර්තු 31 වැනි දිනට නැවත අත්පත් කරගෙන ඇති නීතිවිරෝධීව ලබා ගෙන තිබූ වත්කම්වල වටිනාකම කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

671/'16

7\.

ගරු බිමල් රත්නායක මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2013, 2014 සහ 2015 වර්ෂයන්හිදී ශ්‍රී ලංකාවේ සිය දිවි නසා ගැනීම් සංඛ්‍යාව සහ සිය දිවි නසා ගැනීමට තැත් කිරීම් සංඛ්‍යාව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2013, 2014 සහ 2015 වර්ෂයන්හිදී ශ්‍රී ලංකාවේ සිය දිවි නසා ගැනීම් සංඛ්‍යාව සහ සිය දිවි නසා ගැනීමට තැත් කිරීම් සංඛ්‍යාව;

(i) ස්ත්‍රී, පුරුෂභාවය අනුව;

(ii) වයස් කාණ්ඩ අනුව;

(iii) එක් එක් දිස්ත්‍රික්කය අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2013, 2014 සහ 2015 වර්ෂයන්හිදී සිය දිවි නසා ගැනීම් හා සිය දිවි නසා ගැනීමට තැත් කිරීම් වැඩිම සංඛ්‍යාවක් වාර්තා වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 25 කවරේද;

(ii) සිය දිවි නසා ගැනීම් හා සිය දිවි නසා ගැනීමට තැත් කිරීම් පිළිබඳ නිවැරදි දත්ත හා තොරතුරු වාර්තා කරන රාජ්‍ය ආයතනය කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

707/'16

8\.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රුසියාවේ, ශ්‍රී ලංකා තානාපතිවරයා ලෙස උදයංග වීරතුංග මහතා කටයුතු කළ කාලවකවානුව කවරේද;

(ii) ඔහුට එරෙහිව ඇති චෝදනා කවරේද;

(iii) එම චෝදනා සම්බන්ධයෙන් සිදුකර ඇති විමර්ශනවල ප්‍රගතිය කවරේද;

(iv) ඔහුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද වීමට හේතු කවරේද;

(v) ඔහුව අත්අඩංගුවට ගැනීම සඳහා ජාත්‍යන්තර පොලිසියේ සහාය ඉල්ලා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

725/'16

9.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, හන්දෙස්ස, මහ/අල්මනාර් ජාතික පාසලට අයත්, තෙමහල් ගොඩනැගිල්ල පිහිටා තිබෙන ස්ථානය පසුගියදා නාය යෑමට ලක්වූ බවත්;

(ii) ඒ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් අංක ED/7/99/9/1/31 හා 2015.12.14 දිනැති ලිපිය මඟින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අධ්‍යක්ෂවරයා දැනුවත් කළද, මෙතෙක් කිසිදු පියවරක් ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) අධික වර්ෂා සහිත කාලගුණ තත්ත්වයකදී, එකී පාසැල් ගොඩනැගිල්ල හා එහි අවට අවදානම් තත්ත්වයක පවතින හෙයින්, නාය යෑමට ලක් වූ පස් කන්දට ආසන්නව ආරක්ෂිත බැම්මක් ඉදිකිරීම සඳහා පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

521/'16

10.

ගරු බුද්ධික පතිරණ මහතා,— අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1815 වර්ෂයේ සිට 1948 වර්ෂය දක්වා කාලය තුළ මෙරට පාලනය කළ බ්‍රිතාන්‍ය ජාතිකයන් විසින් නිදහස් සටනට උරදුන් ඇතැම් ශ්‍රී ලාංකේය නායකයන් රාජද්‍රෝහීන් ලෙස නම් කළ බවත්;

(ii) මේ වනතෙක් එම නායකයන්ගේ නම් එම ලැයිස්තුවෙන් ඉවත් නොකළ බවත්;

(iii) ඒ පිළිබඳව රජයේ අවධානය මෙතෙක් යොමු වී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) බ්‍රිතාන්‍යයන් රාජද්‍රෝහීන් ලෙස නම් කළ ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් කවරේද;

(iii) ඔවුන් රාජද්‍රෝහීන් ලෙස නම් කිරීමට දක්වා ඇති හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම නායකයන් රාජද්‍රෝහී ලැයිස්තුවෙන් ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) මෙම නායකයන් ජාතික වීරයන් ලෙස නම් කිරීමට රජය කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

637/'16

11.

ගරු වාසුදේව නානායක්කාර මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂයේදී පසුගිය රජය විසින් ක්‍රියාත්මක කරන ලද "දොරින් දොරට - ගමින් ගමට" වැඩසටහන යටතේ රත්නපුර, කුරුවිට ප්‍රාදේශීය සභාව සමඟ කිරිඇල්ල, හාදුකන්ද සමෘද්ධි සමිතිය ගිවිසුමකට එළඹී ඇති බවත්, එම ගිවිසුම අනුව හාදුකන්ද, කුරුඳුකොටුව මාර්ගය කපා කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් රුපියල් ලක්ෂ 3ක මුදලක් ගෙවන බවට ගිවිසුම් ගතවූ බවත්;

(ii) ගිවිසුම අනුව ඉහත කී මාර්ගයේ වැඩ අවසන්කර වර්ෂයක් ගතවී ඇතත්, මේ වනතෙක් ඉහත කී සමිතියට ගෙවා ඇත්තේ 20% මුදලක් (රු.58,000/-) පමණක් බවත්;

(iii) ඉතිරි මුදල් මේ වනතෙක් නොගෙවීමෙන් සමිතිය මහත් අපහසුතාවයකට පත් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කොන්ත්‍රාත්තුවේ ඉතිරි මුදල ඉහත සමිතියට ලබාදීමට පියවර ගන්නේද;

(ii) මීට අමතරව, පහත දක්වා ඇති මාර්ගයන් කොන්ක්‍රීට් කිරීම සඳහා;

බදුවල මාර්ගයේ, ඉහළ කොටස - රු.500,000/-

හාදුකන්ද, පොල්ගහහේන මාර්ගය - රු. 300,000/-

හාදුකන්ද, ඉලුක්පිටිය මාර්ගය - රු. 300,000/-

හාදුකන්ද, කැකිල්ලවත්ත මාර්ගය - රු. 300,000/-

සමිතිය වෙත ගෙවීමට ඇති මුදල් ඉක්මනින් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

655/'16

12.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 ජනවාරි 10 දින සිට 2016 අප්‍රේල් 30 දින දක්වා කාල පරිච්ඡේදය තුළ සිය රාජකාරි හෝ පෞද්ගලික ගමන් සඳහා ගුවන් හමුදාව සතු හෙලිකොප්ටර් හෝ ගුවන් යානා යොදා ගත් දේශපාලනඥයන්, රජයේ නිලධාරින් සහ වෙනත් පුද්ගලයන් වෙන් වෙන් වශයෙන් කවුරුන්ද;

(ii) එම ගුවන් ගමන් සඳහා එක් එක් පුද්ගලයාගෙන් අය කළ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ගුවන් ගමන් සඳහා අය විය යුතු මුදලින් මෙතෙක් ගෙවා නොමැති මුදල කොපමණද;

(iv) එම හිඟ මුදල් අය කර ගැනීම සඳහා ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

672/'16

13.

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනාධිපතිවරයා, අග්‍රාමාත්‍යවරයා, අමාත්‍යවරයන්, මන්ත්‍රීවරයන් සහ හිටපු ජනාධිපතිවරයන් සඳහා වෙන් කර ඇති කොළඹ නගරය තුළ පිහිටි මුළු නිල නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම නිල නිවාස දැනට භාවිත කරන පුද්ගලයන්ගේ නාමලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(iii) මෙම නිල නිවාස වෙන් කිරීම සඳහා අනුගමනය කරන රෙගුලාසි සඳහන් චක්‍රලේඛයක් හෝ ලේඛනයක් තිබේද;

(iv) එසේ නම්, එය සභාගත කරන්නේද;

(v) රෙගුලාසි ලේඛනයක් නොමැති නම්, නිවාස වෙන් කරනු ලබන පටිපාටිය කවරේද;

(vi) නිවාස වෙන් කරනු ලබන රෙගුලාසි හෝ පටිපාටියට අනුව සුදුසුකම් සපුරා නොමැතිව නිවාසවල රැඳී සිටින්නන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

708/'16

14.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 මැයි සිට 2015 ජනවාරි දක්වා කාලසීමාව තුළ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මඟින් වෙළඳ දැන්වීම් ලබාදුන් ජනමාධ්‍ය ආයතන කවරේද;

(ii) එම එක් එක් ජනමාධ්‍ය ආයතනයට වෙළඳ දැන්වීම් ලබාදුන් දිනය, දැන්වීමේ වටිනාකම, එක් එක් ජනමාධ්‍ය ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## **යෝජනා පිළිබඳ දැනුම්දීම**

1.

ගරු කේ. කාදර් මස්තාන් මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"බර්ටි දිසානායක පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා,— කාර්මික ආරවුල් පනත යටතේ නියෝග,— කලින් කලට සංශෝධනය කරන ලද, 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනතේ (131 වැනි අධිකාරය වූ) 39 වැනි වගන්තිය යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016.07.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග (අංක 1),— 2016 ජූනි 22 දිනැති අංක 1972/33 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින්, සිංහල හා දෙමළ භාෂා පිටපත්වල මුද්‍රණ දෝෂ නිවැරදි කරනු ලැබූ, මෝටර් වාහන පනතේ (203 වැනි අධිකාරය වූ) 122 වගන්තිය සහ VII අ කොටස සමඟ කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 නොවැම්බර් 02 දිනැති අංක 1939/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.07.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග (අංක 2),— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 213ඇ වගන්තිය සමඟ කියවියයුතු, එකී පනතේ 237 වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 දෙසැම්බර් 22 දිනැති අංක 1946/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*5.

විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

නීති කොමිෂන් සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 147 — වැඩසටහන 1,— † 2016 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භ වන හා 2016 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් දැනටමත් අනුමත කර ඇති වියදම් සීමා නොඉක්මවන පරිදි එහි විවිධ වැය ශීර්ෂ යටතේ අපේක්ෂිත ඉතිරිවීම් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වැය ශීර්ෂයේ "අයවැය සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතියට" මාරුකර ගැනීමටත් 2015 අංක 16 දරන විසර්ජන පනතේ 6.1 හා 6.2 වගන්ති මඟින් සලසා ඇති විධිවිධානවලට යටත්ව හඳුනාගත් විදේශ මූල්‍යකරණ සහිතව ක්‍රියාත්මකවන සංවර්ධන ව්‍යාපෘති කඩිනම් කිරීම සඳහා ප්‍රමුඛත්වය දෙමින් පරිපූරක ප්‍රතිපාදන ලෙස අදාළ අමාත්‍යාංශවලට මාරු කිරීමට හැකිවන පරිදි ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ රජයට අයත් අනෙකුත් ඕනෑම අරමුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව විසින් මූල්‍යකරණය කරන ලද රුපියල් පනස්නව කෝටි විසිනව ලක්ෂ විසිපන්දහසක් (රු.592,925,000) නොඉක්මවන මුදලක් උපලේඛනයේ දක්වා ඇති ආකාරයට සලසා ගත යුතු ය.

**උපලේඛනය**

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 147 | - ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය | |
| වැඩ සටහන | 1 | - මෙහෙයුම් වැඩසටහන | |
| පුනරාවර්තන වියදම් | | - | රු. 469,425,000 |
| මූලධන වියදම් | | - | රු. 123,500,000 |
| | | මුළු වියදම = | **රු. 592,925,000** |

(රුපියල් පනස්නව කෝටි විසිනව ලක්ෂ විසිපන්දහසක් පමණි.)

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ''බී'' ගිණුම**

| | |
|---|---|
| උපරිම වියදම් සීමාව | - රු. 2,000,000 |
| අවම ලැබීම් සීමාව | - රු. 150,000 |
| උපරිම හර ශේෂ සීමාව | - රු. 3,500,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

† 2016 අගෝස්තු මස 09 වැනි දින ඉදිරිපත් කරන ලද 2016 අංක 2 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 එකතුව රුපියල් 55,000,000.

*10.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරියගේ වැටුප හා දීමනා ප්‍රතිශෝධනය කිරීම,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16 (1) වගන්තිය අනුව කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යයන් ඉටුකරලීම පිණිස එම කොමිෂන් සභාවට සහාය වීමට අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත්කිරීමට සහ එම තනතුර දරන තැනැත්තාට පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන වැටුපක් ගෙවීමට විධිවිධාන සලස්වා දී ඇති හෙයින්ද;

අවදානමක් දැරිය යුතු තනතුරක් වන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට 2015.02.12 දින රජයේ අවශ්‍යතාවය මත නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිසිටර් ජනරාල් ධූරයේ රාජකාරි කළ ජනාධිපති නීතිඥ ඒ. ඒ. පී. දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය පත්කිරීම මත, ඇයට පෞද්ගලික වන සේ පහත සඳහන් වැටුප් හා දීමනා 2015.02.12 දින සිට ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) අතිරේක සොලිසිටර් ජනරාල් තනතුරට හිමි මාසික වැටුප සහ සියලු දීමනා (දුරකථන දීමනාව, ඉන්ධන දීමනාව සහ නිවාස කුලී දීමනාව හැර);

සහ

(ආ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ධූරයට හිමි අමාත්‍යාංශ ලේකම් දීමනාව, දුරකථන දීමනාව, ඉන්ධන දීමනාව හා රජයේ නිල නිවාසයක් ලබාදී නොමැති නම් නිවාස කුලී දීමනාව.

ඊට අනුකූලව, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16 (2) වගන්තිය ප්‍රකාරව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්, ජනාධිපති නීතිඥ ඒ. ඒ. පී. දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප හා දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ස්වාධීන කොමිෂන් සභාවන්හි සභාපතිවරයන් හා සාමාජිකයින් වෙත ගෙවනු ලබන පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා,— දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ආ) ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් ස්වාධීන කොමිෂන් සභා නවයෙහි සභාපතිවරයන් හා සාමාජිකයින් වෙත පහත සඳහන් පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා, අදාළ කොමිෂන් සභා සත්‍ය වශයෙන්ම රාජකාරි ආරම්භ කරන ලද දිනය, අදාළ ගෙවීම් බලාත්මක වන දිනය ලෙස සලකමින් ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) නිල බලයෙන් පත්වන සභාපතිවරයන් හැර අනෙකුත් සභාපතිවරයන් සඳහා රු. 100,000/-ක මාසික දීමනාවක් ද, රු. 10,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, පෞද්ගලික භාවිතයට ද හිමිකම් සහිත නිල වාහනයක් සහ එකී වාහනය සඳහා ඉන්ධන ලීටර් 225ක් හෝ වෙළඳපොළේ පවත්නා ඉන්ධන මිල ගණන්වලට අනුරූපව දීමනාවක්ද;

(ආ) නිල බලයෙන් පත්වන ස්වාධීන කොමිෂන් සභා සභාපතිවරයන් සඳහා තම නිත්‍ය තනතුරේ වැටුප් හා දීමනාවලට අතිරේකව, ස්වාධීන කොමිෂන් සභාවන්හි සභාපතිවරයෙකුගේ මාසික දීමනාවෙන් 50%ක මාසික දීමනාවක්ද;

(ඇ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ හැර අනෙකුත් ස්වාධීන කොමිෂන් සභාවල නිල බලයෙන් පත් නොවන සාමාජිකයින් සඳහා රු. 75,000/-ක මාසික දීමනාවක්ද, රු. 8,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, තම පදිංචි ස්ථානයේ සිට කොමිෂන් සභා කාර්යාලයට යාමට ඇති දුර ප්‍රමාණය අනුව කිලෝ මීටර් 350 දක්වා රු. 25,000/-ක ප්‍රවාහන දීමනාවක් හෝ කිලෝ මීටර් 350ට වැඩි දුර ප්‍රමාණයක් වෙනුවෙන් රු. 50,000/-ක ප්‍රවාහන දීමනාවක්ද;

(ඈ) 2015.06.17 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 3/2015 විධිවිධාන පරිදි නිල බලයෙන් පත්වන සාමාජිකයින් සඳහා එක් රැස්වීම් වාරයකට සහභාගි වීම වෙනුවෙන් රු. 10,000/-ක දීමනාවක්ද;

(ඉ) 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ (8) වැනි වගන්තියට අනුව එම කොමිෂන් සභාවේ සභාපතිට හා සමානව සාමාජිකයින්ට ද බලතල පැවරී ඇති බැවින්, එම කොමිෂන් සභාවේ සාමාජිකයින්ට රු. 95,000/-ක මාසික දීමනාවක් ද, රු. 8,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, පෞද්ගලික භාවිතයට ද හිමිකම් සහිත නිල වාහනයක් හා එම වාහනය සඳහා ඉන්ධන ලීටර් 170ක් හෝ වෙළඳපොළේ පවත්නා ඉන්ධන මිල ගණන්වලට අනුරූපව දීමනාවක්;

සහ

(ඊ) මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා හා සාමාජිකයින් වෙත, මැතිවරණයක් ප්‍රකාශයට පත් කළ දින සිට ප්‍රතිඵල නිකුත් කරන දින දක්වා වූ කාලසීමාව සඳහා ඔවුන්ගේ මාසික දීමනාවෙන් ¾ක විශේෂ දීමනාවක් ද.

ඊට අනුකූලව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ආ) ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් ස්වාධීන කොමිෂන් සභා නවයෙහි සභාපතිවරයන්ට හා සාමාජිකයින්ට ඉහත සඳහන් පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*13.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*14.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*15.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**